
# මලීගේ

# පූස් පවුල



මිනුලි සුරක්තා ඉල්මලී  කෙහෙල්ඇල්ල

# මලීගේ

# පූස් පැටවුල

මිනුලි සුරක්තා ඉල්මලී කෙහෙල්ඇල්ල

# මලිගේ පූස් පවුල



මිනුලි සුරක්තා ඉල්මලී කෙහෙල්ඇල්ල

9 ශ්‍රේණිය D

මහමායා බාලිකා විදුහල

මහනුවර

චිත්‍ර හා කෘතියේ අයිතිය - මිනුලි සුරක්තා ඉල්මලී කෙහෙල්ඇල්ල

ප්‍රථම මුද්‍රණය - 2021 ජනවාරි

දෙවන සංස්කරණය - 2025 ජනවාරි

ISBN : 978 -624-206-022-4

# පිදුම

ආදරණීය

අම්මා ට

අප්පච්චි ට

කිරි අම්මා ට

මාමලා සැම ට

නැන්දලා සැම ට

අක්කලා ට

අයියා ට


සමන්මලී ගුරුතුමිය ට

9 D පන්තියේ මගේ යෙහෙළියන් ට

සහ

මගේ පූස් පවුලට

සෙනෙහසින් පුදමි.



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණ ගත්කරණී** "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලාතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර

# ස්තූතිය

සැමදා මගේ ජීවිතයට ශක්තියක් වන මගේ ආදරණීය අම්මා ටත් අප්පච්චි ටත් මගේ ස්තූතිය පළමුව පුදකරමි. මහමායාවට පියනැගු පළමු දිනේ හිස අතගා හොඳින් ඉගෙනගෙන දිරිය දියණියක් වන්නැයි ආශිවර්ාද කළ අයි. විතානාච්චි හිටපු විදුහල්පති මැණියන් ට මගේ හද පිරි ස්තූතිය පුද කරමි. වතර්මානයේ මහමායා බාලිකාවේ විදුහල්පති මැණියන්ටත්, මහමායා ප්‍රාථමිකයේ විදුහල්පති මැණියන්ටත් අකුරු කරන්නට කියා දී මා මැණිකක් මෙන් ඔප මට්ටම් කිරීමට වෙහෙස වූ මහමායා බාලිකාවේ ගුරු මැණිවරුන්ටත් පියවරුන්ටත් මගේ සෙනෙහස පුදකරමී.

සැමදා මගේ ඉදිරි ගමනට ඔවදන් දෙමින් පහන් වැටක් සේ ජීවිතයට එළිය දෙන සමන්මලී ගුරුමැණියන්ට විශේෂ ස්තූතිය පුදකරමි.

මිනුලි සුරක්තා ඉල්මලී කෙහෙල්ඇල්ල

# හැඳින්වීම

එක්තරා ගමක ජීවත් වුණ “ මලී ” කියන කරුණාවන්ත ගැහැණු ළමයා මුහුණ දුන් සත්‍ය සිදුවීමක් ගැන කියවෙන මේ කතාව මම මුලින්ම ලියුවේ මම 5 A පන්තියේ ඉගෙන ගන්නකොටයි. පසුගිය වසර හතරක කාලයේ පූස් පවුලේ සිදුවුනු වෙනස්කම් අල්ලලා මම මේ පොත සංස්කරණය කළා.

ඔයාලත් කියවලා බලන්න මගේ පූස් පවුලේ පුංචි කතන්දරය.



මම,

මහනුවර බාලිකා විදුහලේ,

9 D පන්තියේ,

මිනුලි සුරක්තා ඉල්මලී කෙහෙල්ඇල්ල

මලී කියන්නේ පුංචි ගැහැණු ළමයෙක්. එයා ජීවත් වුණේ නගරයෙන් ටිකක් ඈතට වෙන්න තිබුණ අධර් නාගරික ගමක. එයත් එක්ක එයාගේ අම්මයි, අප්පච්චියි, නැන්දයි, මාමයි, අත්තම්මායි ජීවත් වුණා. මේ හැමෝම මලීට හරිම ආදරෙයි. ඉතිං මලී සතුටින් ජීවත් වුණා. හැබැයි එයාගේ හිතේ පුංචි දුකක් තිබුණා. ඒ තමා එයාට සෙල්ලම් කරන්න කවුරුත් නැති එක. මලී තමයි පවුලේ එකම දරුවා. ඒක නිසා ගෙදර කවුරුවත් හිටියේ නැහැ එයා එක්ක සෙල්ලම් කරන්න.



මලී ඉගෙන ගත්තේ නගරයේ තිබුණ ප්‍රසිද්ධ බාලිකා පාසලක. එයා හැමදාම උදේට අප්පච්චි එක්ක බස් එකේ පාසල් යනවා. එක දවසක් උදේ මලී අප්පච්චි එක්ක පාසල් යන්න පිටත් වුණා. එයාලා යද්දි පාර අයිනේ කාණුවකින් කවුදෝ කෙඳිරිගාන ශබ්දයක් ඇහුණා.

මලී නතර වෙලා බැලුවා ඒ ශබ්දය ආවේ කොහෙන්ද කියලා. බලනකොට කාණුවේ ඉන්නවා පුංචි පූස් පැටියෙක්.වැස්සට තෙමිලා කාණුව ඇතුලේ ගුලිවෙලා හිටපු පූස් පැටියා මලී දිහා ඇස් බෝල කරගෙන බැලුවා. මලීට හුඟක් දුක හිතුනා පූස් පැටියා ගැන.

``අනේ, අප්පච්චි මට මේ පූස් පැටියා ඕන. අපි මේ පූස් පැටියා ගෙදර අරගෙන යමු ද?" මලී අප්පච්චිගෙන් ඇහුවා.

``දැන් අපිට පරක්කු වෙනවා දුවේ. අපි යමු" අප්පච්චි කිව්වා.

``අනේ, අප්පච්චි එතකොට මේ පූස් පැටියා මැරිලා යයි. " මලී දුකෙන් කිව්වා.

අප්පච්චි කාණුවෙන් පූස් පැටියා අරගෙන ඉක්මනට ගෙදර ගිහින් මාමාට පූස්පැටියා දීලා ආවා. මලී සතුටින් පාසල් ගියා.

එදා දවස ම මලී පාසලේ සතුටින් හිටියා. එයා යාළුවන්ටත් කිව්වා එයාට අද පූස් පැටියෙක් හම්බ වුණා කියලා. පාසල ඇරුනම මලී සතුටින් දුවගෙන ගෙදර ආවා.


First Aid kit
Kitty
cat food
cat food
cat food
food
water

මලී ගෙදර එනකොට මාමා පූස් පැටියාව නාවලා, කන්න කෑමත් හදලා දීලා. ඒ පූස් පැටියා හරිම කෙට්ටුයි. ඇඟ පුරා ම තුවාල. ලෝමත් හැලිලා. ඒත් මලී හරිම ආදරයෙන් පූස් පැටියා දිහා බලන් හිටියා.

‘‘ මලී, බලන් හිටියට කමක් නැහැ. ඒත් පූස් පැටියා අල්ලන්න එපා. ඔයා ට ලෙඩ හැදේවි. ” කියලා අම්මා කිව්වා.

මලී පූස් පැටියට නමක් තිබ්බා “ කිටී “ කියලා. එදා ඉදන් කිටී මලිගේ ගෙදර සාමාජිකයෙක් වුණා.

මාමා හැමදා ම කිටී ව නාවලා ඇඟේ බෙහෙත් තෙල් ගෑවා. මලීගේ මාමා වෙද මහත්තයෙක් නිසා එයා බෙහෙත් ගැන

දන්නවා. මාමාගේ බෙහෙත් නිසා කිටී ටිකෙන් ටික සුව අතට හැරුනා. ඒක දකිනකොට මලී ට හරි ම සතුටුයි. මලී හැමදාම කිටී ට කිරි හදලා දුන්නා. කිටී ව ආදරයෙන් රැක බලා ගත්තා. ටික දවසක් යනකොට ඇගේ ලෝම පිරිලා වලිගේ ලස්සන වෙලා, ඇස් දිළිසිලා කිටී ලස්සන පූසියෙක් වුණා.

කාලය ගත වුණා. මලී පාසල් ගිහින් ඇවිත් කිටී එක්ක සෙල්ලම් කළා. පාඩම් වැඩත් කළා. අම්මට ත් උදවු කළා. දැන් මලී හරිම සතුටෙන් ජීවත් වෙනවා. ගෙදර කිටී ට නිදාගන්න කොට්ටයක් දාපු පෙට්ටියක් හදලා තිබුණා. කිටී නිදා ගත්තේ එතන. මාස ගණනකට පස්සේ දවසක මාමා මලීට අලුත් ආරංචියක් කිව්වා.


Kitty
CA
T
CAT

‘‘ මලී, ළඟදී ම ඔයාට තවත් යාළුවෝ ගොඩක් ලැබෙන්න යන්නේ. ඔයා කැමති ද.?’’ මාමා ඇහුවා.

‘‘ අනේ, කොච්චර හොඳද ? කවු ද මාමේ ඒ යාළුවෝ. ’’ මලී ඇහුවා.

‘‘ බලාගෙන ඉන්නකෝ ටික දවසක්. ’’ මාමා කිව්වා.

එක දවසක් මලී පාසල් ඇරිලා එනකොට ගෙදර අය හරි සතුටින් බලා හිටියා.

‘‘ මොක ද හැමෝම සතුටින්. මොකද්ද රහස. ? ’’ මලී නැන්දාගෙන් ඇහුවා

‘‘ ඔයා බලන්නකෝ. අපේ ගෙදර ට නෑදෑයෝ ඇවිත්. ’’ නැන්දා කිව්වා.

‘‘ කෝ......... කෝ..........කවුද? ...... කවුද? ’’ කියමින් මලී ගේ ඇතුළට දුවගෙන ආවා.

අත්තම්මා මලී ට කිටීගේ පෙට්ටිය පෙන්නුවා. මලී දුවලා ගිහින් බලනකොට පුංචි පූස් පැටව් ටිකක් කිටීව බදාගෙන කිරි බොනවා. මලී සතුටින් උඩ පැන්නා. එයා පූස් පැටව් ව ගනන් කරන්න පටන් ගත්තා.

‘‘ එකායි........ දෙකායි.......තුනයි...... ’’ ගැනලා බලනකොට පැටව් හත් දෙනයි. මලී ට සතුට ඉවසන්න බැහැ.

‘‘ අම්මේ, මට දැන් පූසෝ අට දෙනයි. පූස් අම්මයි පැටව් හතයි. ’’ එයා හරි ම සතුටෙන් කෑ ගහලා අම්මට කිව්වා.

මලී ඒ පූස් පැටවුන් ට නම් දැම්මා. සිංකි, පිංකි, චුට්ටි, පැංචි, දඟයා, ස්නෝවි, බ්‍රව්නි.


CAT
FOOD
cat
food

බෝල බෝල පුංචි පැටව් හරි ම ලස්සනයි. පූස් අම්මා පැටව් ටික හරිම ආදරයෙන් බලාගත්තා.

මලී පූස් අම්මාට කිරි හදලා දීලා, කෑම හදලා දීලා හොඳින් පෝෂණය කළා. පූස් අම්මා පූස් පැටව් ට අදරයෙන් කිරි පෙව්වා.

දැන් පූස් පැටව් ටිකක් ලොකුයි. බෝල බෝල පැටව් ගේ පූරාම දුවනවා. පුටු අස්සේ මේස අස්සේ හැංගෙනවා. බලන්න හරිම ලස්සනයි. පූස් අම්මා පූස් පැටව් හත් දෙනාට හරිම ආදරෙයි. පූස් අම්මා ට කන්න මාළු කූරියෙක් දුන්නාම එයා ඒක කන්නේ නැතුව පැටව් ට කන්න ගිහින් දෙනවා. පැටව් වට කරගෙන කිරි දෙනවා. ඇත්තට ම ඒ හරිම ලස්සන පූස් පවුලක්. පූස් පවුලේ හැමෝම යි පුංචි මලී යි හරිම සතුටින් හිටියා. දවසක් දූක

හිතෙන දෙයක් වුණා. ගෙදරට ආව පොඩි ළමයෙක් පූස් පැටියෙක් ඉල්ලලා අඬපු නිසා අප්පච්චි එයාට පූස් පැටියෙක් දුන්නා. මලී එදා රෑ අඬලා අඬලා නිදාගත්තා.

පහුවදා අම්මයි, අප්පච්චියි මලී ව ළඟට අරන් මෙහෙම කිව්වා.

'' අපිට පූසෝ අට දෙනෙක් හදන්න බැහැ. අපි එයාලාව හදාගන්න කැමති අයට දෙමු. අලුත් ගෙවල් වල එයාලා සතුටින් ඉඳිවී. ''

මලීට තේරුණා අම්මලා කියන්නේ ඇත්ත කියලා. එයා ඒකට කැමති වුණා. ඊට පස්සේ පූස් පැටව් අරන් යන්න කැමති අයට ඒ පූස් පැටව් එක එකා දුන්නා. ඒ හැම දවසකම මලී ඇස් දෙකේ කඳුළු පුරවන් බලා හිටියා. හැබැයි

මලී පූස් පැටව් දෙන්නෙක් එයා ගාව තියා ගත්තා. ඒ සිංකියි , පිංකියි. දැන් පූස් අම්මයි, පූස් දුවයි, පූස් පුතයි මලීගේ ගෙදර සතුටින් ජීවත් වෙනවා.

දවසක් උදේ බලනකොට මලීගේ ගෙදර මිදුලේ තවත් පූසෙක් හිටියා. ඒ පූසා පැටව් වගේමයි. හරියට එකම පවුලක වගෙයි.

‘‘ ඒ තමා පූස් තාත්තා ’’ මාමා කිව්වා. මලී එයාටත් කෑම දුන්නා. පූස් තාත්තත් මලීගේ ගෙදර නතර වුණා. දැන් මලී ට පූස් පවුලක් ඉන්නවා. පූස් තාත්තයි, පූස් අම්මායි, පූස් දුවයි, පූස් පුතයි. එයාලා මලීගේ ගෙදර සතුටින් ජීවත් වුණා.

ඔයාලා දන්නව ද මලී එදා බේරගත්ත පූස් පැටියා නිසා අද ලස්සන පූස් පවුලක් එයාට ලැබිලා. සතුන්ට කරුණාවන්ත වීම හොඳ ගතිගුණයක්. මලීගේ කරුණාව තුළින් අද ලස්සන පූස් පවුලක් සතුටින් ජීවත් වෙනවා. ඔයාලත් මලී වගේම සතුන්ට ආදරය කරන්න පුරුදුවෙන්න.

වසර හතරකට පසු සටහන

අවුරුදු හතරක කාලයක් ගතවුණා. පූස් පවුලෙයි මලීගේ පවුලෙයි වෙනස්කම් රාශියක් වුණා. මලීගේ ආදරණීය අත්තම්මා වසර 100ක් ජීවත් වෙලා ජීවිතයෙන් සමුගත්තා. පූස් තාත්තත් වයසට ගිහින් ජීවිතය හැරගියා. පූස් දුවයි පූස් පුතයි ලොකු පූසන් වුණා.

පූස් පුතා සිංකි වෙනම පවුලක් හදාගත්තා. එයාටත් දැන් දරුවෝ ඉන්නවා. ඉස්සර දවසකට දෙකකට සැරයක් ගෙදර ආපු සිංකි දැන් එන්නෙම නැහැ. සිංකි මිය ගිහින්ද ජීවත් වෙනවාද කියලාවත් මලී දන්නේ නැහැ. ඒත් පාරෙදි පූසෙක් දකින වාරයක් පාසා මලී ඒ එයාගේ සිංකිද කියලා හැරිලා බලනවා.

දැන් මලීත් ලොකු ගැහැනු දරුවෙක්. එයාගේ ගෙදර අම්මයි, අප්පච්චියි, නැන්දයි, මාමයි, පූස් අම්මයි, පූස් දූවයි එක්ක එයා සතුටින් ජීවත් වෙනවා. එයා දැන් පාඩම් වැඩ කරන්නේ අත්තම්මාගේ කාමරේ. කොච්චර සතුටින් ජීවත් වුනත් අත්තම්මා, සීයා , සිංකි මතක් වෙනකොට මලීගේ ඇස් දෙකේ කඳුලු බිංදු දිලිසෙනවා.

ඒත් ඔයාලා දන්නවද මලීට දැන් අලුත් යාළුවෙක් ඉන්නවා. එයාගේ නම බූනී.... එයා තමයි මලීගේ පුංචි බලුපැටියා.

නිමි.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සඳහා පිරිවෙන් භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ඇදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි තම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්